# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 57 දරන
# පළාත් පාලන ආයතන (තක්සේරු කිරීම් ප්‍රතිශෝධනය කිරීමේ සහ වරිපනම් අඩු කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1979 සැප්තැම්බර් මස 4 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1979 සැප්තැම්බර් මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ

II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

තැපැල් ගාස්තුව : ශත 25 යි

මිල : ශත 75 යි

**1979 අංක 57 දරන පළාත් පාලන ආයතන (තක්සේරු කිරීම් ප්‍රතිශෝධනය කිරීමේ සහ වරිපනම් අඩු කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1979 සැප්තැම්බර් මස 4 වන දින]

එල්. ඩී.—ඕ. 1/79.

අමාත්‍යවරයා විසින් විධාන කරනු ලබන ඇතැම් අවස්ථාවල දී පමණක් පළාත් පාලන ආයතනවල දේපළවල වාර්ෂික වටිනාකම් තක්සේරු කිරීම ප්‍රතිශෝධනය කිරීම සඳහා ද ඇතැම් අවස්ථාවල දී වරිපනම් අත්හැරීමට හෝ අඩු කිරීමට බලය දීමට අමාත්‍යවරයාට බලය පැවරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වෙන පරිදි පළාත් පාලන ආයතනවලට අදාළ නීතිය සංශෝධනය කිරීමට විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1979 අංක 57 දරන පළාත් පාලන ආයතන (තක්සේරු කිරීම් ප්‍රතිශෝධනය කිරීමේ සහ වරිපනම් අඩු කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

### මහා නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම

2. 1967 අංක 8 දරන පනතින් සංශෝධිත මහා නගර සභා ආඥාපනතේ 230 වන වගන්තියේ (1අ) උපවගන්තියට ඉක්බිති ව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— මහා නගර සභා ආඥාපනතේ 230 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1ආ) යම් පසුගිය වර්ෂයක් තුළ මේ වගන්තිය යටතේ සභාව විසින් නියම කරන ලද වරිපනම්—

(අ) ප්‍රමාණවත් සේවා නොසලසා නියම කරනු ලැබ තිබෙන බව අමාත්‍යවරයාගේ මතය වන්නා වූ ද; නැතහොත්

(ආ) සම්පූර්ණයෙන් ම හෝ ඒ වරිපනම්වලින් යම් කොටසක් සහ ඒ වරිපනම් අයකර ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු අත්හැරීම සියළු අවස්ථානුගත කරුණු අනුව යුක්තිසහගත හා සාධාරණ බව ආණ්ඩුවේ අනුමතය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද

අවස්ථාවක, ඒ වරිපනම් සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් සහ ඒ වරිපනම් අයකර ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු අත්හැරීමට අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය.

(1ඇ) නියම කරනු ලැබූ යම් වරිපනම් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් සහ දරන ලද යම් ගාස්තු ද අත්හැරීමට (1ආ) උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් බලය දී ඇති විටෙක—

(අ) ඒ වරිපනම් සහ දරන ලද යම් ගාස්තු ද ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී, අත්හරිනු ලැබූ වරිපනම්වල සහ ගාස්තුවල මුදල් ප්‍රමාණය ඒ වරිපනම් ගෙවනු ලැබ ඇති දේපළ සම්බන්ධයෙන් අනාගතයේ දී අයවිය යුතු වරිපනම් වෙනුවට හිලව් කිරීම; හෝ

(ආ) ඒ වරිපනම් සහ දරන ලද යම් ගාස්තු ද ගෙවනු ලැබ නො මැති අවස්ථාවක දී ඒ වරිපනම්වල සහ දරන ලද ගාස්තුවල මුදල් ප්‍රමාණය අත්හැරීම හෝ

සභාව විසින් කළ යුතු ය.

ඒ මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට කිසිම තැනැත්තකුට අයිතිවාසිකමක් නැත්තේ ය.".

මහ නගර සභා ආඥාපනතේ 238 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. 1971 අංක 48 දරන පනතින් සංශෝධිත මහ නගර සභා ආඥාපනතේ 238 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"වාර්ෂික වරිනාකම් තක්සේරු කිරීම.

238. (1) අමාත්‍යවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් විධානය කරනු ලැබූ විට පමණක් මහා නගර සභාවක් විසින් අලුත් තක්සේරුවක් සකස් කළ යුතු ය. යම් මහා නගර සභා ප්‍රදේශයක, ඒ මහා නගර සභා ප්‍රදේශයේ අලුත් සේවාවන් සැලසීම හෝ දැනට පවත්නා සේවාවන් වැඩි දියුණු කිරීම සැලකිල්ලට ගෙන, යම් පන්තියකට හෝ වර්ගයකට අයත් නිශ්චල දේපළ හෝ සියලු නිශ්චල දේපළ සම්බන්ධයෙන් අලුත් තක්සේරුවක් සකස් කිරීමට අමාත්‍යවරයා විසින් විධාන කළ හැකි ය. අමාත්‍යවරයාගේ විධාන මත අලුත් තක්සේරුවක් කර ගෙන යනු ලබන විට හැර, විශේෂ අවස්ථාවල දී අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් වෙනස් කිරීම් සමග ඉහතින් වූ වර්ෂය සඳහා අගැයුම හෝ තක්සේරුව, පසුව එළඹෙන වර්ෂය සඳහා අගැයුම හෝ තක්සේරුව වශයෙන්, සභාව විසින් සම්මත කළ යුතු ය:

එසේ වුව ද සෑම විට ම ඒ අගැයුම සහ තක්සේරුව පිළිබඳ දැන්වීම නියමිත ආකාරයෙන් දෙනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා වෙත කරනු ලැබූ කරුණු ඉදිරිපත් කිරීම් හේතුවෙන් හෝ අමාත්‍යවරයාගේ ම කැමැත්ත අනුව හෝ සුදුසු යයි ඔහු විසින් සලකනු ලැබිය හැකි ආකාරයකින්, යම් පසු ගිය වර්ෂයක් සම්බන්ධයෙන් එම කාලයේ දී සලසා තිබූ සේවාවන් සැලකිල්ලට ගෙන, වාර්ෂික වරිනාකම් තක්සේරුව ප්‍රතිශෝධනය කිරීම ඔහු විසින් විධාන කළ හැකි.

(3) (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයාගේ විධානයක් අනුව තක්සේරු ප්‍රතිශෝධනය කිරීමේ ප්‍රතිඵලයක් විශයෙන් යම් දේපළක් සම්බන්ධයෙන් වරිපනම් අඩු කිරීමක් සිදු වී ඇති විටෙක—

(අ) ඒ වරිපනම් ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී ඒ වරිපනම් ගෙවනු ලැබ ඇති දේපළ සම්බන්ධයෙන් අනාගතයේ දී අය විය යුතු වරිපනම් වෙනුවට එසේ අඩු කරනු ලැබූ වරිපනම් සහ ඒ වරිපනම් අය කර ගැනීමේ කාර්යය සඳහා දරන ලද ගාස්තු ද හිලව් කිරීම ; හෝ

(ආ) ඒ වරිපනම් ගෙවනු ලැබ නොමැති අවස්ථාවක දී ඒ වරිපනම්වල සහ දරන ලද යම් ගාස්තුවල මුදල් ප්‍රමාණය අත් හැරීම හෝ

සභාව විසින් කළ යුතු ය.

ඒ මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට කිසිම තැනැත්තකුට අයිතිවාසිකමක් නැත්තේ ය.".

## II වන කොටස

### නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම

4. නගර සභා ආඥාපනතේ 130 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— නගර සභා ආඥාපනතේ 130 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය අවසානයට පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :—

"(2) යම් පසුගිය වර්ෂයක දී (1ආ) උපවගන්තිය යටතේ සභාව විසින් නියම කරන ලද විශේෂ වරිපනම් බද්ද—

(අ) ප්‍රමාණවත් සේවා නොසලසා නියම කරනු ලැබ තිබෙන බව අමාත්‍යවරයාගේ මතය වන්නා වූ ද ; නැතහොත්

(ආ) සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් සහ ඒ විශේෂ වරිපනම් බද්ද අයකර ගැනීමේ කාර්යය සඳහා දරන ලද ගාස්තු ද අත්හැරීම අවස්ථානුගත සාධාරණ බව, කරුණු අනුව යුක්තිසහගත හා සාධාරණ බව, අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතිය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද

අවස්ථාවක, ඒ විශේෂ වරිපනම් බද්ද සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් සහ ඒ විශේෂ වරිපනම් බද්ද අයකර ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු අත්හැරීමට අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය.

(3) නියම කරනු ලැබූ යම් විශේෂ වරිපනම් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් සහ ඒ වරිපනම් අයකර ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු ද අත් හැරීමට (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් බලය දී ඇති විටෙක—

(අ) ඒ විශේෂ වරිපනම් ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී වරිපනම් වල සහ දරන ලද යම් ගාස්තුවල මුදල් ප්‍රමාණය ඒ වරිපනම් ගෙවනු ලැබ ඇති දේපළ සම්බන්ධයෙන් අනාගත යේ දී අයවිය යුතු වරිපනම් වෙනුවට හිලව් කිරීම ; හෝ

(ආ) ඒ විශේෂ වරිපනම් ගෙවනු ලැබ නොමැති අවස්ථාවක දී ඒ වරිපනම්වල සහ දරන ලද යම් ගාස්තුවල මුදල් ප්‍රමාණය අත් හැරීම හෝ

සභාව විසින් කළ යුතු ය.

ඒ මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට කිසිම තැනැත්තකුට අයිතිවාසිකමක් නැත්තේ ය.".

නාගර සභා ආඥාපනතේ 160 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. නාගර සභා ආඥාපනතේ 160 වන වගන්තියේ (2) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (2අ) යම් පසුගිය වර්ෂයක් තුළ මේ වගන්තිය යටතේ සභාව විසින් නියම කරන ලද වරිපනම් බද්ද—

(අ) ප්‍රමාණවත් සේවා නොසලසා නියම කරනු ලැබ තිබෙන බව අමාත්‍යවරයාගේ මතය වන්නා වූ ද ; නැතහොත්

(ආ) සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් සහ ඒ වරිපනම් බද්ද අයකර ගනු ලැබීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු අත්හැරීම අවස්ථානුගත සියලු කරුණු අනුව යුක්තිසහගත හා සාධාරණ බව ආණ්ඩුවේ අනුමතය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද

අවස්ථාවක, ඒ වරිපනම් බද්ද සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් සහ ඒ වරිපනම් බද්ද අයකර ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු අත්හැරීමට අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය.

(2 ආ) නියම කරනු ලැබූ යම් වරිපනම් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් සහ ඒ වරිපනම් අයකර ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු ද අත් හැරීමට (2අ) උප වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් බලය දී ඇති විටෙක—

(අ) ඒ වරිපනම් ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී අත් හරිනු ලැබූ වරිපනම්වල සහ දරන ලද යම් ගාස්තු වල මුදල් ප්‍රමාණය ඒ වරිපනම් ගෙවනු ලැබ ඇති දේපළ සම්බන්ධයෙන් අනාගතයේදී අය විය යුතු වරිපනම් වෙනුවට හිලව් කිරීම; හෝ

(ආ) ඒ වරිපනම් ගෙවනු ලැබ නොමැති අවස්ථාවක දී වරිපනම්වල සහ දරන ලද යම් ගාස්තුවල මුදල් ප්‍රමාණය අත් හැරීම

සභාව විසින් කළ යුතු ය.

ඒ මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට කිසිම තැනැත්තකුට අයිති වාසිකමක් නැත්තේ ය.".

III වන කොටස

සුළු නාගර සභා ආඥාපනත සංශෝධනය කිරීම

6. සුළු නාගර සභා ආඥාපනතේ 129 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— සුළු නාගර සභා ආඥාපනතේ 129 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය අවසානයට පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :—

"(2) යම් පසුගිය වර්ෂයක දී (1 ආ) උපවගන්තිය යටතේ සභාව විසින් නියම කරන ලද විශේෂ වරිපනම් බද්ද—

(අ) ප්‍රමාණවත් සේවා නොසලසා නියම කරනු ලැබ තිබෙන බව අමාත්‍යවරයාගේ මතය වන්නා වූ ද ; නැතහොත්

(ආ) සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් සහ ඒ වරිපනම් අයකර ගනු ලැබීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තුවක් අත් හැරීම අවස්ථානුගත සියලු කරුණු අනුව යුක්තිසහගත හා සාධාරණ බව ඇණ්ඩුවේ අනුමතය ඇතිව, තමා විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද

අවස්ථාවක, ඒ විශේෂ වරිපනම් සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් සහ ඒ වරිපනම් අයකර ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු අත් හැරීමට අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය.

(3) නියම කරනු ලැබූ විශේෂ වරිපනම් සම්පූර්ණයෙන් හෝ ඉන් යම් කොටසක් සහ ඒ වරිපනම් අයකර ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු ද අත් හැරීමට (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් බලය දී ඇති විටෙක—

(අ) ඒ විශේෂ වරිපනම් ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී වරිපනම් සහ දරන ලද යම් ගාස්තුවල ප්‍රමාණය ඒ වරිපනම් ගෙවනු ලැබ ඇති දේපළ සම්බන්ධයෙන් අනාගතයේ දී අයවිය යුතු වරිපනම් වෙනුවට හිලව් කිරීම ; හෝ

(ආ) ඒ විශේෂ වරිපනම් ගෙවනු ලැබ නොමැති අවස්ථාවක දී ඒ වරිපනම්වල සහ දරන ලද යම් ගාස්තුවල මුදල් ප්‍රමාණය අත් හැරීම

සභාව විසින් කළ යුතු ය.

ඒ මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට කිසිම තැනැත්තකුට අයිතිවාසිකමක් නැත්තේ ය. ".

7. 1967 අංක 8 දරන පනතින් සංශෝධිත ළුළු නගර සභා ආඥාපනතේ 159 වන වගන්තියේ (1අ) උපවගන්තියට ඉක්බිති වහාම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

ළුළු නගර සභා ආඥා පනතේ 159 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (1ආ) යම් පසුගිය වර්ෂයක් තුළ මේ වගන්තිය යටතේ සභාව විසින් නියම කරන ලද වරිපනම්—

(අ) ප්‍රමාණවත් සේවා නොසලසා නියම කරනු ලැබ තිබෙන බව අමාත්‍යවරයාගේ මතය වන්නා වූ ද; නැතහොත්

(ආ) සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් සහ ඒ වරිපනම් අයකර ගනු ලැබීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු අත්හැරීම අවස්ථානුගත හා සාධාරණ සියලු කරුණු අනුව යුක්තිසහගත හා බව ආණ්ඩුවේ අනුමතය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද

අවස්ථාවක, ඒ වරිපනම් සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් සහ ඒ වරිපනම් අයකර ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු අත් හැරීමට අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

(1ආ) නියම කරනු ලැබූ වරිපනම් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් සහ ඒ වරිපනම් අයකර ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් ගාස්තු ද අත්හැරීමට (1ආ) උප වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් බලය දී ඇති විටෙක—

(අ) ඒ වරිපනම් ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී වරිපනම් වල සහ දරන ලද ගාස්තුවල මුදල් ප්‍රමාණය ඒ වරිපනම් ගෙවනු ලැබ ඇති දේපළ සම්බන්ධයෙන් අනාගතයේ දී අයවිය යුතු වරිපනම් වෙනුවට හිලව් කිරීම; හෝ

(ආ) ඒ වරිපනම් ගෙවනු ලැබ නොමැති අවස්ථාවක දී ඒ වරිපනම්වල සහ දරන ලද යම් ගාස්තුවල මුදල් ප්‍රමාණය අත් හැරීම හෝ

සභාව විසින් කළ යුතු ය.

ඒ මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට කිසිම තැනැත්තකුට අයිතිවාසිකමක් නැත්තේ ය.".

## IV වන කොටස

### ගම් සහ ආඥාපනත සංශෝධනය කිරීම

8. 1971 අංක 48 දරන පනතින් සංශෝධිත ගම්සහා ආඥාපනතේ 37 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— (ගම්සභා ආඥාපනතේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.)

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(2අ) යම් පසුගිය වර්ෂයක් තුළ මේ වගන්තිය යටතේ සභාව විසින් නියම කරන ලද තක්සේරු බද්ද—

(අ) ප්‍රමාණවත් සේවා නොසලසා නියම කරනු ලැබ තිබෙන බව අමාත්‍යවරයාගේ මතය වන්නා වූ ද; නැතහොත්

(ආ) සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් හෝ අත්හැරීම යුක්තිසහගත හා අවස්ථානුගත සියලු කරුණු අනුව සාධාරණ බව ආණ්ඩුවේ අනුමතය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද

අවස්ථාවක, ඒ තක්සේරු බද්ද සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් හෝ අත්හැරීමට අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය.

(2ආ) නියම කරනු ලැබූ තක්සේරු බද්ද සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ අත්හැරීමට (2අ) උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් බලය දී ඇති විටෙක—

(අ) ඒ තක්සේරු බද්ද ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී, ගෙවා ඇති බදු ප්‍රමාණය ඒ තක්සේරු බද්ද ගෙවා ඇති දේපළ සම්බන්ධයෙන් අනාගතයේ දී අයවිය යුතු යම් බද්දක් වෙනුවට හිලව් කිරීම; හෝ

(ආ) ඒ තක්සේරු බද්ද ගෙවනු ලැබ නොමැති අවස්ථාවක දී ඒ බදු ප්‍රමාණය අත්හැරීම; හෝ

සභාව විසින් කළ යුතුය.

ඒ තක්සේරු බද්ද ආපසු ලබා ගැනීමට කිසිම තැනැත්තකුට අයිතිවාසිකමක් නැත්තේ ය.".

(2) ඒ වගන්තියේ (8) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(8) (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් තක්සේරු බද්ද අය කිරීමේ කාර්යය සඳහා අලුත් තක්සේරුවක් කිරීමට අමාත්‍යවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් විධාන කරනු ලැබූ විට පමණක් ගම් සභාවක් විසින් අලුත් තක්සේරුවක් සකස් කළ යුතු ය. යම් ප්‍රදේශයක යම් වැඩි දියුණු කළ ප්‍රදේශයක යම් පන්තියකට හෝ වර්ගයකට අයත් නිශ්චල දේපළ සඳහා පමණක් හෝ සියලු නිශ්චල දේපළ සම්බන්ධයෙන් හෝ අලුත් තක්සේරුවක් සකස් කිරීමට ඒ ගම් ප්‍රදේශයේ එසේ වැඩිදියුණු කළ ප්‍රදේශයෙහි අලුත් සේවා සැපයීම හෝ පවත්නා සේවා වැඩිදියුණු කිරීම කෙරෙහි සැලකිලිමත්ව අමාත්‍යවරයා විසින් විධාන කළ හැකි ය. අමාත්‍යවරයාගේ විධාන මත අලුත් තක්සේරුවක් කරගෙන යනු ලබන විට හැර, විශේෂ අවස්ථාවන්හි දී, පෙරාතුව වූ වර්ෂය සඳහා වූ අගැයීම හෝ තක්සේරුව, අවශ්‍ය යයි සලකනු ලබන වෙනස් කිරීම් සහිතව, පසුව එළඹෙන වර්ෂය සඳහා අගැයීම හෝ තක්සේරුව වශයෙන් සභාව විසින් පිළිගනු ලැබිය යුතු ය:

එසේ වුව ද සෑමවිටම ඒ අගැයීම සහ තක්සේරුව පිළිබඳ දැන්වීම නියමිත ආකාරයෙන් දෙනු ලැබිය යුතු ය."; තව ද,

(3) ඒ වගන්තියේ (8) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(9) අමාත්‍යවරයා වෙත කරනු ලැබූ කරුණු ඉදිරිපත් කිරීම් හේතුවෙන් හෝ අමාත්‍යවරයාගේ ම කැමැත්ත අනුව හෝ සුදුසු යයි ඔහු විසින් සලකනු ලැබිය හැකි ආකාරයකින් යම් පසුගිය වර්ෂයක් සම්බන්ධයෙන් තත් කාලයේ දී සලසා තිබූ සේවාවන් සැලකිල්ලට ගෙන වාර්ෂික වටිනාකම් තක්සේරුව ප්‍රතිශෝධනය කිරීම ඔහු විසින් විධාන කළ හැකි ය.

(10) (9) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයාගේ විධානයක් මත තක්සේරු ප්‍රතිශෝධනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් තක්සේරු බද්ද හෝ විශේෂ වරිපනම් හෝ අඩුකිරීමක් සිදු වී ඇති විටක—

(අ) ඒ තක්සේරු බද්ද හෝ විශේෂ වරිපනම් හෝ ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී එසේ අඩු කරනු ලැබූ බද්දෙහි සහ විශේෂ වරිපනම්වල මුදල් ප්‍රමාණය ඒ තක්සේරු බද්ද හෝ විශේෂ වරිපනම් හෝ ගෙවනු ලැබ ඇති දේපළ සම්බන්ධයෙන් අනාගතයේ දී අය විය යුතු බදු හෝ විශේෂ වරිපනම් වෙනුවට හිලව් කිරීම; හෝ

(ආ) ඒ බද්ද හෝ විශේෂ වරිපනම් හෝ ගෙවනු ලැබ නොමැති අවස්ථාවක දී එසේ අඩු කරනු ලැබූ ඒ බද්දේ හෝ වරිපනම්වල මුදල් ප්‍රමාණය අත් හැරීම

සභාව විසින් කළ යුතු ය.

ඒ මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට කිසිම තැනැත්තකුට අයිතිවාසිකමක් නැත්තේ ය.".

9. 1961 අංක 60 දරන පනතින් ඇතුළත් කරනු ලැබූ ගම් සභා ආඥාපනතේ 40අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ගම්සභා ආඥාපනතේ 40අ වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තිය අවසානයට පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :—

"(2) යම් පසුගිය වර්ෂයක දී (1) (ආ) උපවගන්තිය යටතේ සභාවක් විසින් විශේෂ වරිපනම් නියම කරනු ලැබ ඇත්තේ ප්‍රමාණවත් සේවා නොසලස්වා බව අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, ඒ විශේෂ වරිපනම් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ අත් හැරීමට අමාත්‍යවරයා විසින් බලය දීම නීත්‍යනුකූල වන්නේ ය.

(3) නියම කරනු ලැබූ විශේෂ වරිපනම් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ අත් හැරීමට (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් බලය දී ඇති විටෙක—

(අ) ඒ විශේෂ වරිපනම් ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී, එසේ ගෙවනු ලැබූ වරිපනම්වල මුදල, ඒ විශේෂ වරිපනම් ගෙවනු ලැබ ඇති දේපළ සම්බන්ධයෙන් අනාගතයේ දී අය විය යුතු වරිපනම් වෙනුවට හිලව් කිරීම;

හෝ

(ආ) ඒ විශේෂ වරිපනම් ගෙවනු ලැබ නොමැති අවස්ථාවක, විශේෂ වරිපනම්වල මුදල් ප්‍රමාණය අත් හැරීම

සභාව විසින් කළ යුතු ය.

ඒ මුදල් ප්‍රමාණය ආපසු ලබා ගැනීමට කිසිම තැනැත්තකුට අයිතිවාසිකමක් නැත්තේ ය.".

3—ඒ 43004 (79/07)